

වාර්ෂික වාර්තාව - 2018

ஆண்டறிக்கை - 2018

Annual Report - 2018

හෝමියෝපති වෛද්‍ය සභාව

ஹோமியோபதி மருத்துவ சபை

Homoeopathic Medical Council

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර.

දුරකථන අංක : 011-2958175 ෆැක්ස්: 011-2958175

E mail : homosri.mcouncil@gmail.com.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு

Ministry of Health, Nutrition & Indigenous Medicine



වාර්ෂික වාර්තාව

2018

හෝමියෝපති වෛද්‍ය සභාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය

පටුන

පිටුව

1. සාරාංශය 02

2. හැඳින්වීම 03

3. හෝමියෝපති වෛද්‍ය සභාව 04

4. පසුබිම් විස්තරය 05

5. වෛද්‍ය සභාවේ අරමුණු 07

6. වෛද්‍ය සභාව සතු බලතල 08

7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධුර කාලය 10

8. සංස්ථාපිත තොරතුරු 11

9. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2018 12

10. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය 14

11. වාර්ෂික ගිණුම් වාර්තා 29

12. විගණන වාර්තාව

13. සුභාසිංශන

01. සාරාංශය

වෛද්‍ය සභාවේ අරමුණ සහ බලාත්මක නීති හා සම්ප්‍රදායන්ට අනුකූලව මෙම වසරේ සමස්ත ක්‍රියාකාරිත්වය ඇගයීමේ අරමුණින්, හෝමියෝපති වෛද්‍ය සභාවේ 2018 වාර්ෂික වාර්තාව මෙසේ එළි දක්වනු ලැබේ.

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව පිහිට වූ ප්‍රථම සභාව වන හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018.10.19 දක්වා බල පැවති අතර මෙම කාලය තුළ වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ මෙම සභාව විසිනි. සභාවේ ගිණුම් කටයුතු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය මඟින් මෙහෙයවිනි.

අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව වෙත යොමු කර තිබූ 2016 අංක 10 දරණ හෝමියෝපති පනත බලාත්මක කිරීම සඳහා සම්පාදිත නීති, රෙගුලාසි හා රීති කෙටුම්පත් සම්මත කර ගැනීමෙහි ලා මෙම වසරේ සභාව බල පැවති මාස 10 පුරාම උත්සාහ දරණ ලද අතර, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ පුළුල්ව හා ස්ථාවරව ගොඩනැගීමේ අරමුණු සහිතව තවත් කෙටුම්පත් කිහිපයක් සම්පාදනය කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මේ අනුව හෝමියෝපති පනත සම්පාදනයේ දී හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පිහිටුවීමෙන් අපේක්ෂා කෙරුණු අරමුණු ඉටු කරලීම උදෙසා මෙම සභාව සිය නිල කාලය අවසන් වන තෙක්ම උපරිම වශයෙන් ක්‍රියා කල බව සඳහන් කල හැකිය.

හෝමියෝපති වෛද්‍ය සේවාව දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා දැනට පවත්වා ගෙන යමින් සිටින සායන 7 ට අමතරව දිස්ත්‍රික්ක 7 ක නව සායන 7 ක් ආරම්භ කිරීම සඳහා වන පුරෝගාමී කාර්යයන් කිහිපයක් මෙම වසර තුළ දී සම්පූර්ණ කරන ලදී. නව සායන ආරම්භ කිරීමට අවශ්‍ය තනතුරු අනුමැතිය 2016 වසරේ දී ලබා ගෙන තිබුණද මෙම සායන ආරම්භ කිරීම සඳහා පැවති මූලිකම බාධාව වූයේ රජයට අයත් ගොඩනැගිලි සහිත ස්ථාන ලබා ගැනීමට නොහැකි වීමය. එහෙත් මෙම වසරේ දී ස්ථාන 6 ක් හඳුනා ගෙන එයින් ස්ථාන 3ක ම ගොඩනැඟිලි වැඩි දියුණු කිරීමත්, ඒවායෙහි සායන ආරම්භ කිරීම සඳහා උපකරණ මිල දී ගැනීමත් සිදු කරන ලදී. දිවයිනේ දිස්ත්‍රික්ක 7ක පවත්වාගෙන යනු ලැබූ රජයේ හෝමියෝපති සායන මඟින් ප්‍රතිකාර ලබාගත් රෝගීන්ගේ සංඛ්‍යාව 81,089 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව මෙය ඉහළ අගයක් විය. දිස්ත්‍රික්ක 6කින් ම මෙම වර්ධනය පෙන්නුම් කර තිබුණි. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ සමාජ දැනුවත්භාවය වර්ධනය කිරීමේ සම්මන්ත්‍රණ 16ක්, ජංගම සායන 16ක්, රූපවාහිනී වැඩසටහන් 17ක්, ගුවන් විදුලි වැඩසටහන් 17ක් පැවැත්වූ අතර පුවත්පත් සඳහා ලිපි 44ක් සභාවේ මෙහෙයවීම මත වෛද්‍යවරුන් විසින් සපයනු ලැබීය. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සංවර්ධනය උදෙසා මානව සම්පත් වර්ධනය කිරීමට අදාළව හෝමියෝපති වෛද්‍ය සභාවේ ප්‍රධාන කාර්ය වන්නේ සුදුසුකම් ලත් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයින්ගේ ප්‍රමාණය වර්ධනය කිරීම ය. මෙම කාර්යයට උරදෙමින් උපාධිධාරී හෝමියෝපති වෛද්‍යවරුන් 8 දෙනෙකු ලියාපදිංචි කළ අතර 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම උදෙසා පැවැත්විය යුතු විභාගය සඳහා විභාග මණ්ඩලයක් පත්කර, මෙම කාර්යය ඉටු කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විභාග අංශය වෙත පවරා ඇත. හෝමියෝපති ඖෂධ ආනයනය වෙනුවෙන් වෛද්‍යවරුන් වෙත ඩොලර් 33274.36ක් වටිනා බලපත්‍ර සඳහා අනුමැතිය ද ලබාදෙනු ලැබීය.

02. හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය නැසීම ” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වනවිට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රටපුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් එරට මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන බිහිකර තිබීම මඟින් මෙම කරුණ මොනවට පැහැදිලි කෙරේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මඟින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාර ධුර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැගි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස ගැනිය හැකි හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්ය භාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 07 ක රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාපිත කර තිබුණි. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුනෙ, මාතලේ, කුරුණෑගල, හා තෝලංගමුව මෙසේ වෛද්‍ය සභාව මඟින් රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යනු ලැබූ ස්ථාන විය.

03. හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම"

මෙහෙවර

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම."

පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධානවලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. ප්‍රථම වෛද්‍ය සභාව **හෝමියෝපති** අතුරු වෛද්‍ය සභාව ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් නම් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග

1. හෝමියෝපති රෙගුලාසි - 1980

(වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ

රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්, තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජූලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකේ.

05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම.

2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.

3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම.

4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම.

5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම.

6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම.

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම.

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම.

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම.

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම.

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය.

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම.

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම.

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම.

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම.

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම.

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම.

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම.

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධුර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ජන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම්/ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

08. සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	:-	හෝමියෝපති වෛද්‍ය සභාව
ලිපිනය	:-	අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.
දුරකතන අංකය	:-	011-2958175
ෆැක්ස්	:-	011-2958175
විද්‍යුත් තැපෑල		homosri.mcouncil@gmail.com
සංස්ථාපිත ආයතනයේ තත්ත්වය	:-	2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත.
පරිපාලන ව්‍යුහය	:-	ලේකම් / ලේඛකාධිකාරී කාර්යභාර වෛද්‍යවරු කළමනාකරණ සහකාර ඖෂධ සංයෝජක කාර්යාල සහායක
බැංකුකරුවෝ	:-	ලංකා බැංකුව - තැප්රොබේන් ශාඛාව, කොළඹ කොමර්ෂල් බැංකුව - ජා ඇල

09. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2018

ඉලක්ක අංක 01

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධිවිධාන බලාත්මක කිරීම.

උපාය මාර්ග

නීති රීති හා රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.

ඉලක්ක අංක 02

01. පනතේ අංක 30 / 1 දරණ විධිවිධාන යටතේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.
02. හෝමියෝපති සෞඛ්‍ය සත්කාර සේවාව විධිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපූරක සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.
03. වෘත්තීය පිළිගැනීම ලබා දීම හා ලියාපදිංචි කිරීම.

උපාය මාර්ග

- අයදුම්පත් කැඳවීම.
- විභාග මණ්ඩලයක් පත් කිරීම.
- විභාග පැවැත්වීම.
- සමත් වූවන් ලියාපදිංචි කිරීම.
- පරිපූරක සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.
- වෘත්තීය පිළිගැනීම ලබා දීම හා ලියාපදිංචි කිරීම

ඉලක්ක අංක 03

පනතේ විධි විධාන යටතේ හෝමියෝපති සෞඛ්‍ය සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

උපාය මාර්ග

නීති රීති හා නිර්ණායක සම්පාදනය

ඉලක්ක අංක 04

පනතේ විධි විධාන යටතේ හෝමියෝපති ඖෂධ ආනයනය කර වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම.

උපාය මාර්ග

- අවශ්‍යතාවයන් හඳුනා ගැනීම.
- සැපයුම් කරුවන් තෝරා ගැනීම.
- මිල ගණන් කැඳවීම.
- ආනයනය කිරීම.

ඉලක්ක අංක 05

පනතේ විධි විධාන යටතේ රජයේ හෝමියෝපති සායන විධිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම

උපාය මාර්ග

- සේවකයන් බඳවා ගැනීම.
- වැටුප් දීමනා හා සේවක සංඛ්‍යා අනුමත කර ගැනීම.
- කාර්ය සාධනය
- දැනුම හා කුසලතා ප්‍රවර්ධනය
- නව සායන ආරම්භ කිරීම හා සේවා ව්‍යාප්ත කිරීම.

ඉලක්ක අංක 06

පනතේ විධි විධාන යටතේ රජයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට අවශ්‍ය රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.

උපාය මාර්ග

- අවශ්‍යතාවයන් හඳුනා ගැනීම හා ජාතික ප්‍රතිපත්තියක් තීරණය කර ගැනීම.
- විදෙස් හෝමියෝපති වෛද්‍ය විද්‍යාල ව්‍යුහයන් අධ්‍යනය කිරීම.
- විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ නිර්ණායකයන් හා කොන්දේසි හඳුනා ගැනීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම.
- රෙගුලාසි සම්පාදනය කිරීම.
- අනුමත කර ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම.

10. හෝමියෝපති වෛද්‍ය සභාව කාර්ය සාධනය

දැක්ම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම.

මෙහෙවර

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.

01. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය සහ කළමනාකරණය

1.1. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය

මෙම වසරේදී හෝමියෝපති වෛද්‍ය සභාව විසින් මෙහෙයවනු ලැබූ රජයේ හෝමියෝපති සායන 07 මඟින් ප්‍රතිකාර ලබාගත් රෝගීන්ගේ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

සායනය	පැමිණි රෝගීන් සංඛ්‍යාව
දෙහිවල	16,447
පරකඩුව	13,732
මාතලේ	10,533
පාලමුනෙ	8,182
කුරුණෑගල	11,349
මොණරාගල	4,768
තෝලංගමුව	16,078
එකතුව	**81,089**

හෝමියෝපති වෛද්‍ය සභාව මගින් මෙහෙයවනු ලබන රජයේ සායනවලට 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ රෝගී පැමිණීම.



2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දී හෝමියෝපති ප්‍රතිකාර සඳහා රෝගීන් රජයේ සායන කරා පැමිණීමේ වර්ධනයක් රටේ දිස්ත්‍රික්ක රැකින්ම වාර්තා වී තිබූ ආකාරය ඉහත වගුවෙන් දිස්වේ.

1.2. රජයේ හෝමියෝපති සායන කළමනාකරණය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන, වසර තුළ දී වැඩිම රෝගීන් සංඛ්‍යාවක් හෝමියෝපති ප්‍රතිකාර ලබා ගන්නා, රටේ පිළිගත් ආයතන පද්ධතියක් බවට මේ වන විට පත්ව ඇත. මෙම වසරේදී ද ඉහත සඳහන් සායන කළමනාකරණයට සහ පහසුකම් ලබා දීමට වෛද්‍ය සභාව ක්‍රියා කරනු ලැබීය. ඒ යටතේ, කාර්ය මණ්ඩල නඩත්තුව, බෙහෙත් සැපයීම, වෛද්‍ය උපකරණ ඇතුළු සායන උපකරණ ලබාදීම, සායනවල ජල, විදුලි හා සනීපාරක්ෂක සේවා පවත්වාගෙන යාම මෙයට අයත්වේ.

02. හෝමියෝපති ජංගම සායන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම.

2.1. හෝමියෝපති වෛද්‍ය සභාව හෝමියෝපති රෝහල සමඟ සංවිධානය කෙරෙන ජංගම සායන.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍ය සභාව විසින් ජංගම සායන පවත්වනු ලබන අතර මේවා වැලිසර හෝමියෝපති රෝහල සමඟ එක්ව සංවිධානය කිරීම මින් එක් ආකාරයක් වේ.

	සායනය පැවැත්වූ ස්ථානය	ගැහැණු	පිරිමි	එකතුව
2018.01.21	රදගුරු එඩිමන්ඩ් පීරිස් විදුහල, හලාවත	**79**	**19**	**98**
2018.02.18	රදගුරු එඩිමන්ඩ් පීරිස් විදුහල, හලාවත	**103**	**33**	**136**
2018.03.11	රදගුරු එඩිමන්ඩ් පීරිස් විදුහල, හලාවත	**112**	**28**	**140**
2018.03.24	සිරි සිද්ධාර්ථාරාම විහාරස්ථානය, පානදුර	**39**	**19**	**58**
2018.05.12	මජීඩ් ෆසල් පල්ලිය, පෙරියම්මුල්ල, මිගමුව	**33**	**21**	**54**
2018.06.12	ජංගම පොලිස් මුරපොල, කුරවලාන	**30**	**16**	**46**

2.2. රජයේ හෝමියෝපති සායන මඟින් සංවිධානය කෙරෙන වැඩමුළු, සම්මන්ත්‍රණ හා ජංගම සායන.

හෝමියෝපති වෛද්‍ය සභාව විසින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන මගින් ද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැඩ සටහන් සංවිධානය කෙරේ. දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළු, සම්මන්ත්‍රණ හා ජංගම සායන මෙයට අයත් වැඩ සටහන් වේ.



2.2.1. දෙහිවල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්.

I. දෙහිවල - ගල්කිස්ස සමාජ මෙහෙවර වැඩසටහන් සමඟ පැවැත් වූ වැඩසටහන්			
ස්ථානය	සම්මන්ත්‍රණ	ජංගම සායන	සහභාගිවුවන් ගණන
කොතලාවල පුර පාසල	1	1	87
නැදිමාල කැලේ පාසල	1	1	85
නැදිමාල ධර්මරාජ විහාරය	1	1	78
රත්මලාන ධර්මාරාම විදුහල	1	1	132
රත්මලාන සදහම් විහාරය	1	1	118
එකතුව	5	5	500

II. "සුව යාත්‍රා "සමාජ සත්කාර වැඩ සටහන යටතේ පැවැත් වූ වැඩසටහන්			
ස්ථානය	සම්මන්ත්‍රණ	ජංගම සායන	සහභාගිවුවන් ගණන
හසලක සුගතාරාමය	1	1	139
අඹන්ගොල්ල ශ්‍රී සුදර්ශනාරාම විහාරය	2	2	268
ඇල්පිටිය ජයබිම සේනාසන විහාරය	1	1	114
ඇල්පිටිය ශ්‍රී විජයාරාම විහාරය	1	1	138
එකතුව	5	5	659

2.2.2 තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්.

ස්ථානය	සම්මන්ත්‍රණ	ජංගම සායන	සහභාගිවුවන් ගණන
තෝලංගමුව විහාරස්ථානය	2	2	242

2.2.3 පරකඩුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්.

ස්ථානය	සම්මන්ත්‍රණ	ජංගම සායන	සහභාගිවුවන් ගණන
කිරිඇල්ල ශ්‍රී සරණාරාම විහාරය	2	1	161
දෙහෙරගොඩ එල්ලාවල පුරාණ විහාරස්ථානය	1	1	72
මාතුගල ශ්‍රී රත්නාරාම විහාරස්ථානය	1	1	96
එකතුව	4	3	329

2.2.4 මොණරාගල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්.

ස්ථානය	සම්මන්ත්‍රණ	ජංගම සායන	සහභාගිවුවන් ගණන
එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශන භූමිය		1	161



මේ අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මෙහෙයවීම යටතේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම උදෙසා පවත්වන ලද සම්මන්ත්‍රණ සංඛ්‍යාව 16 කි. ජංගම සායන සංඛ්‍යාව 16 කි.

03. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිලිබඳ මාධ්‍ය වැඩසටහන්.

දෙහිවල සායනයේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනි වෛද්‍ය අනුෂා හේමකුමාර මිය විසින් මෙම වසර තුළ රූපවාහිනී වැඩසටහන් 17 ක් සහ ගුවන්විදුලි වැඩසටහන් 17 ක් මගින් හෝමියෝපති සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී. පුවත් පත්වලට ඇය මෙම වසරේ දී පමණක් ලිපි 44 ක් සපයා ඇත.

රූපවාහිනී වැඩසටහන්

01. සියත ටීවී - පියුම් විල සජීවී විකාශනය

- *2018.01.19 - සයටිකා රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව.*
- *2018.02.16 - යටිපතුල් වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.03.16 - ඇදුම, හතිය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව.*
- *2018.04.20 - පීනසයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.06.01 - සන්ධි රෝග පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව.*
- *2018.07.04 - උරහිස් වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.08.01 - ඔස්ටියෝ පොරෝසිස් පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව.*
- *2018.09.06 - බෙල්ල හා කොන්ද වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.04 - විෂාදයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.11.01 - මුත්‍රා ආසාදනයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.12.06 - නහර ගැට ගැසීම පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව.*

02. ITN - Coffee Table

- *2018.02.12 - මූත්‍රාශය ආශ්‍රිත ගල් සඳහා හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.04.10 - පිත්තාශ ආශ්‍රිත ගල් සඳහා හෝමියෝපති ප්‍රතිකාර.*

03. ජාතික රූපවාහිනිය - සංහිද වැඩසටහන

- *2018.02.27 - හෝමියෝපත වෛද්‍ය ක්‍රමය හැඳින්වීම.*

04 Colombo TV – Colombo Doctor

- *2018.03.07 - ඔස්ටියෝ ආතරයිටිස් සුවයට ප්‍රතිකාර.*
- *2018.04.03 - කොන්දේ වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.*

05. සිරස ටීවී - ජීවිතයට ඉඩදෙන්න වැඩසටහන

- 2018.10.17 - හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්වීම.

ගුවන් විදුලි වැඩසටහන්

01. ITN ගුවන් විදුලිය - සෙවනට එන්න වැඩසටහන

- 2018.01.04 - ගල්තැලුම් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2018.01.11 - ආඝාතය.
- 2018.01.18 - වකුගඩු රෝගයට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.01.25 - නාසයෙන් ලේ ගැලීම.
- 2018.02.01 - යටිපතුල් වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.02.08 - දියවැඩියාව සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.02.15 - පාදවල හිරිය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.02.22 - ආසාත්මිකතාව සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.03.01 - ගැස්ට්‍රයිටීස් සුව කරන හෝමියෝති ප්‍රතිකාර.
- 2018.03.08 - මුඛ රෝග සඳහා හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.03.15 - සෙම් රෝග හා සමේ රෝග සඳහා හෝමියොපති ප්‍රතිකාර.
- 2018.03.22 - පපුවේ වේදනාව සඳහා හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.03.29 - අක්මාව ආශ්‍රිත රෝග සඳහා හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.04.05 - හිස්සොරි, පොතුකබර, සුදු කබර සඳහා හෝමියොපති ප්‍රතිකාර.
- 2018.04.12 - මානසික ආතතිය නිසා ඇතිවන හිසරදය සඳහා හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.12.28 - වෛරස් උණ රෝගය සුවයට හෝමියොපති ප්‍රතිකාර.

02. V fm – OPD වෛද්‍ය හමුව

- 2018.10.30 - හෝමියෝපති ප්‍රතිකාර හැඳින්වීම.
-

පුවත්පත් ලිපි

01. ඉසිවර පුවත් පත

- 2018. ජනවාරි කලාපය - හිරිවැටීම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 පෙබරවාරි කලාපය - ගල්තැලුම් නිවටාවට සුවය ගෙනෙන හෝමියෝපති ප්‍රතිකාර
- 2018 මාර්තු කලාපය - සන්ධි රෝග පූර්ණ සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2018 අප්‍රේල් කලාපය - කොන්ද කැක්කුමට හෝමියෝපති ප්‍රතිකාර.

- 2018 මැයි කලාපය - රෝග සුවයට සුවිශේෂී වූ හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 ජූනි කලාපය - ඇගිලි අගුළු වැටීම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 ජූලි කලාපය - සයටිකා පාද වේදනා සුවයට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 අගෝස්තු කලාපය - හිසරදය, ඉරුවාරදයට නිසැක සුව ගෙනෙන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 සැප්තැම්බර් කලාපය - ඔස්ටියෝ පොරෝසිස්වලට නිත තබන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 ඔක්තෝම්බර් කලාපය - අපස්මාරයට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018 නොවැම්බර් කලාපය - ඉඹේම මූත්‍රා පිටවෙන්නේ ඇයි විසඳුම හෝමියෝපති ප්‍රතිකාර තුළින්.
- 2018 දෙසැම්බර් කලාපය - සෙලියුලයිටිස් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.



02. සිරිකත පුවත් පත

- 2018.08.27 - හෝමියෝපති ප්‍රතිකාර හැඳින්වීම.

03. කරුණු පුවත් පත

- 2018.02.28 - අන්පාද ඇදය නැති කිරීමට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.03.28 - හිරිවැටීම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.05.30 - පාකින්සන් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.07.12 - ආතරයිටීස් නිසැක සුවයට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.08.15 - කොන්දේ වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.09.12 - ඔස්ටියෝ පොරෝසීස්වලට නිත තබන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.10.24 - හිසරදය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.
- 2018.11.28 - සයටිකා රෝගයට හෝමියෝපති ප්‍රතිකාර.

04. ලක්බිම පුවත් පත

- *2018.04.29 - ආතරයිටිස් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.05.20 - බෙල්ලේ වේදනවට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.06.17 - අත්පා හිරිවැටීමට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.07.15 - කොන්දේ වේදනාව සුවපත් කරන හෝමියෝපති ප්‍රතිකාර.*

05. දිවයින (සදුදා) පුවත්පත

- *2018.06.04 - රෝග සුවයට සුවිශේෂී වූ හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.07.09 - සන්ධි රෝග නිසැක සුවයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.09.10 - හිසරදය, ඉරුවාරදය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.22 - පාකින්සන් රෝගී ජීවිත නැවත පණ ගන්වන හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.11.19 - හිරිවැටීම සුවකරන හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.12.10 - අස්ථි දිරායාම වළකාලන හෝමියෝපති ප්‍රතිකාර.*



06. දිවයින (ඉරිදා) පුවත්පත

- *2018.07.22 - හෝමියෝපති වෙදකමින් පාකින්සන් සුවකරන හැටි.*
- *2018.07.29 - හෝමියෝපති වෙදකමින් පාකින්සන් සුවකරන හැටි.*
- *2018.08.05 - හෝමියෝපති වෙදකමින් පාකින්සන් සුවකරන හැටි.*
- *2018.08.12 - හෝමියෝපති වෙදකමින් පාකින්සන් සුවකරන හැටි.*
- *2018.08.19 - හෝමියෝපති වෙදකමින් පාකින්සන් සුවකරන හැටි.*
- *2018.08.26 - හෝමියෝපති ක්‍රමය මඟින් රෝග සුව කරන ක්‍රමය.*
- *2018.09.09 - හෝමියෝපති ක්‍රමය මඟින් රෝග සුව කරන ක්‍රමය.*
- *2018.09.16 - පාකින්සන් රෝගය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.*

- *2018.09.23 - අපස්මාරය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.07 - බෙල්ල වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.14 - පාකින්සන් රෝගය සුව කරන හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.28 - ප්ලැළුව් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර.*
- *2018.10.04 - පාද ඇදය යථා තත්ත්වයට පත්කරන හෝමියෝපති ප්‍රතිකාර.*

04. රජයේ හෝමියෝපති නව සායන ආරම්භ කිරීම.

මහජන සෞඛ්‍ය සේවාව රට තුළ තව දුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් නව සායන 07 ක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට මෙම වසර තුළ දී විශාල වෙහෙසක් දරණ ලදී. නව සායන ආරම්භ කිරීම සඳහා තනතුරු අනුමත කර ගෙන තිබුණ ද මේවා ආරම්භ කිරීමට ප්‍රධානතම බාධාව වූයේ ඒ සඳහා රජයේ ස්ථාන සහ ගොඩනැගිලි නොමැතිකමය.

4.1 හෝමියෝපති නව සායන සඳහා ස්ථාන ලබා ගැනීම සහ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ සභාපති හා වෛද්‍ය සභා කාර්යාලය මගින් රාජ්‍ය නිලධාරීන්ට සහ දේශපාලන අධිකාරීන්ට කරනු ලැබූ විවිධ ඉල්ලීම් වලට අනුව සායන 7 ක් ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික් 7 ක ස්ථාන ලබා ගැනීමට හැකියාව ලැබුණි. ඒවා පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	ස්ථානය	ආයතනය
01. පුත්තලම	පුත්තලම M.O.H ගොඩනැගිල්ල.	මහ නගර සභාව - පුත්තලම.
02. හම්බන්තොට	අම්බලන්තොට ප්‍රා. ලේ. කාර්යාල පරිශ්‍රය.	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
03. මඩකලපුව	මුනායි වීදිය, පුලියන්තිව්.	මඩකලපුව මහ නගර සභාව.
04. කළුතර	විදෙස් මිතුදම , මහ ඉංගිරිය.	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

05. නුවරඑළිය	ආනන්ද දසනායක මාවත, නව නගරය කොත්මලේ	කොත්මලේ ප්‍රා. ලේ. කාර්යාල
06. පොළොන්නරුව	මහජන පුස්තකාල ශ්‍රවණාගාරය, තමන්කඩුව, පොළොන්නරුව.	තමන්කඩුව ප්‍රාදේශිය සභාව
07. ගාල්ල	මහ මෝදර රෝහලෙන් ගොඩනැගිල්ලක් ඉල්ලා ඇත.	

පුත්තලම සායනය සඳහා මහ නගර සභාව විසින් ගොඩනැගිල්ල ලබා දී ඒ සඳහා අවශ්‍ය ගෘහ උපකරණද ලබා දෙන ලදී. හම්බන්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල පසුගිය වසරේ අළුත්වැඩියා කල අතර මෙම වසරේ දී රු. 199, 411 වටිනා ගෘහ භාණ්ඩ සායනයට මිල දී ගැණුනි.

ඉංගිරිය සායන ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම සඳහා රු. 615,375.00 ක් වැය කල අතර ගෘහ උපකරණ මිලදී ගැනීම සහ නාම පුවරුව ඉදි කිරීම වෙනුවෙන් රු.300,974.00ක් වැය කෙරුණි. කොත්මලේ සායන ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම ඉදිරියට තිබිය දීම සායනය විවෘත කිරීමට ක්‍රියා කරමින් රු. 90,239.00 ක් වටිනා ගෘහ භාණ්ඩ සායනය වෙත ලබා දුනි.

4.2. නව සායන සඳහා හෝමියෝපති වෛද්‍යවරුන් බඳවා ගැනීම.

නව සායන 07 ක් සහ හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සඳහා එක් අයෙක් වශයෙන් වෛද්‍යවරුන් 08 දෙනෙකු බඳවා ගැනීමට ලබා ගෙන තිබූ තනතුරු අනුමැතියට අනුව, හෝමියෝපති වෛද්‍ය සභාවේ හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමට අයදුම් පත් කැඳවන ලදී. භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම මඟින් කරනු ලැබූ කැඳවීමට අනුව අයදුම් පත් 29 ක් ලැබුණි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැණුනු වෛද්‍යවරුන් 07 දෙනෙකු සඳහා පත්වීම් ප්‍රදානය කෙරුණි. පත්වීම් ලාභී හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් ගෙන් 06 දෙනෙකු හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් විය. එයින් එක් අයෙකු හෝමියෝපති ඩිප්ලෝමාධාරී වෛද්‍යවරයෙකි.

තනතුර	සුදුසුකම්	ප්‍රමාණය	අනුයුක්ත සායනය
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී	06	පුත්තලම
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී		අම්බලන්තොට
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී		ඉංගිරිය
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී		කොත්මලේ
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී		පොළාන්නරුව
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති උපාධිධාරී		හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය
වෛද්‍ය නිලධාරී	හෝමියෝපති ඩිප්ලෝමාධාරී	01	මඩකලපුව

4.3. නව සායන සඳහා කාර්යාල සහායකයින් (කම්කරුවන්) බඳවා ගැනීම.

ආරම්භ කිරීමට නියමිත හෝමියෝපති නව සායන 07 සඳහා සායන අයත් වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල දැන්වීම් පළ කිරීම මගින් අයදුම් පත් කැඳවන ලදී. අයදුම්කරුවන් 26 දෙනෙකු අයදුම් පත් ඉදිරිත් කර තිබුණි. තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් 07 දෙනෙකු තෝරා ගන්නා ලදී.

05. හෝමියෝපති නව පනත බලාත්මක කිරීම.

1970 අංක 07 දරණ පැරණි හෝමියෝපති පනත ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දුන් ප්‍රධානතම ගැටළුව බවට පත්ව තිබුණේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස රෙගුලාසි සම්පාදනය වී නොතිබීමය. මෙම කරුණ ගැඹුරින් අවබෝධ කර ගැනීම මත 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පත් කෙරුණු පලමු සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව වසර දෙකක නිල කාලය තුළ වැඩිපුරම අවධානය යොමු කලේ නව පනත බලාත්මක කිරීම සඳහා වන රෙගුලාසි සම්පාදනය කිරීම් වෙනුවෙනි. 2017 වසරේ දී අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය. මෙම වසරේ දී අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව එක්ව අවශ්‍ය සංශෝධනයන් සිදු කර ඒවා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට හැකි විය.

06. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

එවකට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මෙහෙය වීම මත ශිෂ්‍යත්ව දිනා ඉන්දියාවේ දී හෝමියෝපති වෛද්‍ය උපාධිය ලබා ගත් හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරු 09 දෙනෙකු වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අයදුම් කර තිබුණි. එයින් 08 දෙනෙකු සඳහා ලියාපදිංචිය ලබා දීමට අතුරු වෛද්‍ය සභාව ක්‍රියා කලේය.

6.1. 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

නව පනතේ මෙම වගන්තිය අනුව වසර 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයෙහි නියුක්තව සිටි අයව වෛද්‍ය සභාව මගින් පවත්වනු ලබන විභාගයකින් සමත්ව. වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව සලසා තිබීම අනුව අදාළ විභාගය පැවැත්වීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයගෙන් අයදුම්පත් කැඳවා තිබුණි. 189 දෙනෙකු ගෙන් යුතු මෙම අයදුම්කරුවන් වෙත විෂය නිර්දේශ හා අදාළ දැනුම් දීම් සිදු කිරීම, විභාග නීති සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යැවීම්. විභාග මණ්ඩලයක් පත්කර එය අමාත්‍යාංශයේ විභාග අංශය සමග සම්බන්ධ කර විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසීම යනා දී වශයෙන් වන මෙයට අදාළ කටයුතු මෙම වසර තුළ දී සම්පූර්ණ කිරීමට හැකි විය.

07. හෝමියෝපති ඖෂධ ආනයනය 2018.

මෙම වසර තුළදී හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් වෛද්‍යවරුන් 4 දෙනෙකු සඳහා අවස්ථා 13ක දී ඩොලර් **33274.36** වටිනා සහ එක් වෛද්‍යවරයෙක් සඳහා යුරෝ 932 ක් වටිනා ඖෂධ ආනයනය සඳහා පහත පරිදි අනුමැතිය ලබා දුනි.

	වෛද්‍යවරයාගේ නම	වටිනාකම	
		ඇ.ඒ.ජ. ඩොලර් (US$)	යුරෝ (€)
1	වෛද්‍ය නිමල් ලීටස්	-	932
2	වෛද්‍ය එස්.ඩී.පී. පෙරේරා	2049.00	
3	වෛද්‍ය නිමල් ලීටස්	2800.00	
4	වෛද්‍ය නිමල් ලීටස්	5938.31	
5	වෛද්‍ය නිමල් ලීටස්	5281.95	
6	වෛද්‍ය බුද්ධික විවිටව්වි	5463.80	
7	වෛද්‍ය නිමල් ලීටස්	918.47	
8	වෛද්‍ය ජේ.ජේ.ජී.කේ. පුනාන්දු	1000.50	
9	වෛද්‍ය ජේ.ජේ.ජී.කේ. පුනාන්දු	940.00	
10	වෛද්‍ය ජේ.ජේ.ජී.කේ. පුනාන්දු	518.40	
11	වෛද්‍ය ජේ.ජේ.ජී.කේ. පුනාන්දු	1350.00	
12	වෛද්‍ය බුද්ධික විවිටව්වි	3257.30	
13	වෛද්‍ය බුද්ධික විවිටව්වි	3756.63	
	මුළු වටිනාකම	**33274.36**	**932**

08. හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ පහසුකම් අභිවර්ධනය කිරීම.

අනු අංකය	කාර්යය	මුදල
01.	ජනේල් දොරවල් සහිතව වායු සමනය කිරීම	528,859.72
02.	ජල ටැංකි ආධාරකයක් හා ජල ටැංකියක් සවි කිරීම.	500,000.00

09. හෝමියෝපති නීති හා ආයතන පද්ධතිය පුළුල් කිරීම.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා,

- පවතින නීති රාමුව ප්‍රසාරණය කිරීම.
- ආයතන පද්ධතිය ප්‍රතිව්‍යුහ ගත කිරීම.
- අවශ්‍යතාව හඳුනාගත් හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ඒ සඳහා අවශ්‍ය කෙටුම් පත් සකස් කර හෝමියෝපති වෛද්‍යවරුන්ට ඉදිරිපත් කර, අවශ්‍ය යෝජනා සංශෝධන සහිතව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.
- හෝමියෝපති වෛද්‍යවරු ඇතුළු 52 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මේ වෙනුවෙන් එක් දින වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී,
    1. හෝමියෝපති ඖෂධ ආනයනය පිළිබඳ ප්‍රතිපත්ති යළි සැකසීම.
    2. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිළිබඳ යෝජනාව.
    3. හෝමියෝපති දෙපාර්තමේන්තු පනත.

    යන පුළුල් යෝජනා 03 පිළිබඳව වෛද්‍යවරු වෙන වෙනම කණ්ඩායම් ලෙස සාකච්ඡා කර අවසන් කෙටුම්පත් සකස් කරන ලදී.

11. වාර්ෂික ගිණුම් වාර්තා

හෝමියෝපති වෛද්‍ය සභාව

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය
- 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- 2018 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ වාර්තාව
- 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

ගිණුම් කරන ප්‍රතිපත්ති

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 1ට අනුව එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහාපෑම" යනපරිදි ඉදිරිපත් කර ඇත. හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්තන හා මූල ධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනයන් සභාවට ලද ප්‍රදානයක් ලෙසත් එසේම එම ප්‍රදානයන්ගෙන් දරනු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

ක්ෂය සඳහා වෙන් කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගන වේ.

2018 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක්ෂය අනුපාතයට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිති අංක 7 (24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත.

2017 දෙසැම්බර් 31 දක්වා වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත.

2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අවසානයේ මිලදී ගත් වත්කම් වර්ෂය තුළ භාවිතයට නොගත් බැවින් ඒවා එම වර්ෂය (2018) සඳහා ක්ෂය කර නොමැත.

වත්කම් වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද අදාළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

පාරිතෝෂික සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින් පනතේ සඳහන් පරිදි වසර පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සඳහා පමණක් පාරිතෝෂික සඳහා වෙන්කරනු ලැබ ඇත.

හොමියෝපති වෛද්‍ය සභාව

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2018 රු	2017 රු
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	2,404,226	2,274,507
ජංගම නොවන වත්කම්			
පිරියත හා උපකරණ	2	2,126,578	1,715,119
ගොඩනැගිලි පුනුරුත්තාපන		5,407,281	4,227,506
වෙනත් උපකරණ		1,450	1,450
		7,535,309	**5,944,075**
මුළු වත්කම්		**9,939,535**	**8,218,582**
බැරකම්			
ජංගම බැරකම			
ගෙවිය යුතු දෑ	3	**1,141,508**	**844,316**
ජංගම නොවන බැරකම්			
මුළු බැරකම්		1,141,508	844,316
ශුද්ධ වත්කම්		8,798,027	7,374,266
		9,939,535	**8,218,582**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ප්‍රාග්ධනය		2,562,144	2,562,144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන(සංචිත)		7,502,334	5,677,925
සමුච්චිත ඌනතා / අතිරික්තතා		(1,236,035)	(893,263)
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම		(30,416)	27,460
		8,798,027	**7,374,266**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොමියෝපති වෛද්‍ය සභාව විසින් දරණු බව සහතික කරමු

.....	.....	.....	.....
ලේඛකාධිකාරි	සභාපති	කමිටු සමාජික	සකස් කළේ
හොමියෝපති	හොමියෝපති	හොමියෝපති	කේ.එස්.පීසසිරි
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	විශ්‍රාමික ප්‍රධාන
			ගණකාධිකාරි
			දේශීය වෛද්‍ය
			අමාත්‍යාංශය

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරි
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

	2018 රු	2017 රු
සටහන 01		
මුදල් හා මුදලට සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,787,553	1,702,684
ලංකා බැංකුව	420,773	375,923
ලංකා බැංකුව රාජගිරිය	195,900	195,900
	2,404,226	**2,274,507**
සටහන 02		
පිරියත හා උපකරණ		
පිරියත හා උපකරණ(ගත්මිල)	3,800,150	3,155,516
අඩුකලා		
සමුච්චිත ක්ෂය	(1,673,572)	(1,440,397)
ශුද්ධ අගය	**2,126,578**	**1,715,119**
සටහන 03		
ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු විගණන ගාස්තු	163,861	143,861
ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු	42,000	-
ගෙවිය යුතු දුරකතන ගාස්තු	5,742	5,643
ගෙවිය යුතු විදුලිය	4,408	4,296
ගෙවිය යුතු ජලය	9,526	9,698
ගෙවිය යුතු වැටුප් හා දීමනා	62,291	98,860
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්	3,590	7,475
ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල්	898	1,869
ගෙවිය යුතු පාරිතෝෂික	840,650	497,614
ගෙවිය යුතු ගමන් වියදම්	6,697	-
ගෙවිය යුතු සායන වියදම්	1,845	-
ගෙවිය යුතු සභාපති දීමනා	-	75,000
	1,141,508	**844,316**

සටහන 04

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 1 ට අනුවය

සටහන 05

ක්ෂය සඳහා වෙන්කිරීම

සැම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තතේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගන වේ ·

2018 දෙසැම්බර් 31 දක්වා සැම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12 % ක්ෂය අනුපාතය වේ ·

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිති අංක 7 (24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත·

2017 දෙසැම්බර් 31 දක්වා වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය සම්පූර්න වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත·

2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අවසානයේ මිලදී ගත් වත්කම් වර්ෂය තුල භාවිතයට නොගත් බැවින් ඒවා එම වර්ෂය (2018) සඳහා ක්ෂය කර නොමැත·

වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද අදාල සම්පූර්න වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ·

2017 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණයෙන් පෙන්නුම් කල, 2017 වර්ෂයේ අවසානයේ මිලට ගත් රු 259,990 වූ නාම පුවරු හතක ක්ෂය සඳහා වියදම් වූ රු 31,199 ක ක්ෂය 2018 වර්ෂයේදී ගනන් බලා එය 2017 වර්ෂයට අදාල වන බැවින් එම මුදල සමුච්චිත ඌනතා අනිරික්තතා ගිණුමට ගලපා ඇත·

සටහන 06

පාරිතෝෂික සඳහා වෙන්කිරීම

2017 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණයෙන් පෙන්නුම් කරන ලද සේවකයන් 19 දෙනෙකුගේ පාරිතෝෂිතයන් සඳහා තවදුරටත් වෙන්කල යුතු රු 343,036 මුදලක් මෙම වර්ෂයේදී (2018) වෙන් කර ඇත·

සටහන් 07

සභාවට එරෙහිව පවතින නඩු 05 ක් ඇති අතර ඒවා පහත පරිදි වේ·

I. වෛද්‍ය සභා කාර්යාලයේ තාවකාලික පදනම්න් සේවය කල ඊ.එම්.ආර්.ඩී. සේරම් යන අය තමාව ,සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව යලි සේවය ඉල්ලා වත්තල කම්කරු විනිශ්චය සභාවේ නඩු පවරා ඇත·

II. අධිකාරි බලයක් රහිතව වෛද්‍ය සභාව විසින් තමාව සේවයෙන් ඉවත් කල බවට ප්‍රකාශ කර, රුපියල් මිලියන තුනක වන්දි මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා ඊ.එම්.ආර්.ඩී. සේරම් යන අය මහගමුව දිසා අධිකරණයේ නඩු පවරා ඇත·නඩු අංකය 13953 M

III. වෛද්‍ය සභාවේ සේවය කළ ඩී.ඒ කුමාරසිංහ යන අය හිග වැටුප් ඉල්ලා ගරු අභියාචනාධිකරණයේ නඩුවක් පවරා ඇත·නඩු අංක 412/2014

IV. දෙහිවල රජයේ හොමියෝපති සායනයේ නිර්වේතන පදනම්න් සේවය කළ වෛද්‍ය නිමල් ගාමිණි විජේතුංග යන අයගේ සේවය අත්හිට වීමට එරෙහිව රුපියල් මිලියන තුනක වන්දි මුදලක් ඉල්ලා ගල්කිස්ස දිසා අධිකරණයේ පවරා ඇති නඩුව·නඩු අංකය 7087/11/ M ·

V. 2011 නොවැම්බර් 11 වන දින දරණ අංක 1732 දරණ ගැසට් පත්‍රයේ හොමියෝපති වෛද්‍ය වෘර්තිකයන්ගේ නම් ලැයිස්තුවේ නම් ඇතුලත් ලියාපදිංචි අංක 184 සිට 192 දක්වා නම් සඳහන් අය වෛද්‍ය සභාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි නොමැති වෛද්‍යවරුන් ලෙසට ප්‍රකාශයක් ලබා දෙන ලෙස ඉල්ලා වෛද්‍ය සභාවේ හිටපු සභාපති වරයකු වූ එස්. ඩී .පී . පෙරේරා යන අය විසින් නඩු පවරා ඇත· නඩු අංක 14318 ·

හොමියෝපති වෛද්‍ය සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	සටහන්	2018 රු	2017 රු
අයභාරය			
රජයේ පුණරාවර්තන ප්‍රතිපාදන		15,632,730	13,786,709
වෙනත් අයභාර	1	47,850	51,000
බැංකු පොලි		87,001	83,047
මුළු අයභාරය		**15,767,581**	**13,920,756**
වියදම			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	2	13,468,291	11,972,353
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	3	71,356	69,990
ක්ෂය හා ක්‍රම ක්ෂය	4	201,976	120,398
වෙනත් වියදම්	5	2,332,399	2,181,798
මූල්‍ය පිරිවැය(බැංකු ගාස්තු)		5,132	6,644
මුළු වියදම		**16,079,154**	**14,351,183**
කාලච්ඡේදය සඳහා ඌනතාවය/අතිරික්තය		(311,573)	(430,427)

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොමියෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු

.....
ලේඛකාධිකාරි
හොමියෝපති
වෛද්‍ය සභාව

.....
සභාපති
හොමියෝපති
වෛද්‍ය සභාව

.....
කමිටු සමාජික
හොමියෝපති
වෛද්‍ය සභාව

.....
සකස් කළේ
කේ.එස්.පියසිරි
විශ්‍රාමික ප්‍රධාන
ගණකාධිකාරි
දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය

ඒ.ජී. පෙරේරා
ලේඛකාධිකාරී
හොමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැද්දාර,
රාගම.

	2018 රු	2017 රු
සටහන 01		
වෙනත් අයභාර		
වාර්ෂික ගාස්තු	26,350	4,050
විවිධ ලැබීම්	21,500	46,950
	47,850	**51,000**
සටහන 02		
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	11,749,368	10,424,323
සේවක අර්ථසාධක අරමුදල්	1,375,138	1,238,424
සේවා නියුක්ති භාර අරමුදල්	343,785	309,606
	13,468,291	**11,972,353**
සටහන 03		
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය වියදම්	17,708	12,896
සංග්‍රහ වියදම්	53,648	57,094
	71,356	**69,990**
සටහන 04		
ක්ෂය හා ක්‍රම ක්ෂය		
2018 වර්ෂයේ ක්ෂය කිරීම්	233,175	-
අඩුකළා 2017 වර්ෂයට අදාල ක්ෂය (සමුච්චිත ඌණතා /අතිරික්ත ගිනුමට හර)	31,199	
2018 වර්ෂයට අදාල ක්ෂය	**201,976**	-
සටහන 05		
වෙනත් වියදම්		
ගණකාධිකාරි ගාස්තු	42,000	
විගණන ගාස්තු	20,000	20,000
දුරකථන ගාස්තු	83,744	80,635
වෛද්‍ය සායන වියදම්	13,126	220,240
විදුලි ගාස්තු	68,806	55,686
ජල ගාස්තු	44,958	64,170
ගමන්වියදම් හා නවාතැන් ගාස්තු	49,972	1,570
ඉන්ධන වියදම්	11,000	13,500
තැපැල් වියදම්	20,785	5,815
මුද්‍රණ වියදම්	120,526	82,690
විවිධ වියදම්	26,522	27,523

භාෂා පරිවර්තන ගාස්තු	30,260	25,740
හැදුනුම්පත් සැකසීමේ වියදම්	-	12,420
සභාපති දීමනා	725,000	1,050,000
වෛද්‍ය සහා රැස්වීම් දීමනා	306,000	258,000
පුවත්පත් දැන්වීම් ගාස්තු	308,200	106,318
සුළු අලුත් වැඩියා ගාස්තු	-	36,761
පාරිතෝෂික වියදම්	343,036	120,730
ප්‍රවාහන වියදම්	1,780	-
වරිපනම්	1,884	-
කුලී වියදම්	36,000	-
නීති ගාස්තු	78,800	-
	2,332,399	**2,181,798**

සටහන් අංක 06

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති (2019) අංක 1 ට අනුවය .එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහාපෑම" යන පරිදි ඉදිරිපත් කර ඇත.

සටහන් අංක 07

2018 වර්ෂය සදහා විගණන ගාස්තු වෙන්කර ඇත .

සටහන් අංක 08

පාරිතෝෂික සදහා වෙන්කිරීම.

2017 වර්ෂයේ ගිණුම් පිළිබද විගනකාධිපතිගේ නිරීක්ෂණයෙන් පෙන්නුම් කරන ලද සේවකයන 19 දෙනෙකුගේ පාරිතෝෂිතය සදහා තව දුරටත් වෙන් කළ යුතු රු 343,036 ක මුදලක් මෙම වර්ෂයට වෙන්කර ඇත.

සටහන් අංක 09

හොමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්තන හා මූලධන වියදම් සදහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන් සභාවට ලැබුනු ප්‍රදානයන් ලෙසත් එසේම එම ප්‍රදානයන්ගෙන් දරණු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

හොමියෝපති වෛද්‍ය සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන්	2018 රු	2017 රු
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
ලැබීම්			
රජයෙන් ලද පුනරාවර්ථන ප්‍රදානය		15,632,730	13,786,709
බැංකු පොලි		87,001	83,047
වෙනත් ලැබීම්	1	47,850	51,000
		15,767,581	**13,920,756**
ගෙවීම්			
සේවක පිරිවැය	2	13,509,715	11,864,149
බැංකු පොලි		5,132	6,644
වෙනත් ගෙවීම්	3	2,123,015	2,109,802
		15,637,862	**13,980,595**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**129,719**	(59,839)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය		**1,824,409**	**2,246,968**
ගොඩනැගිලි පුනුරුත්ථාපන සඳහා		1,179,775	1,414,768
දේපල පිරියත හා උපකරණ		644,634	832,200
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	4	129,719	(59,839)
කාලාවිච්ඡේදය ආරම්භයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ	5	2,274,507	2,334,346
කාලවිච්ඡේදය අවසානයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ	6	**2,404,226**	**2,274,507**

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොමියෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු.

.....	.....	.....	.....
ලේඛකාධිකාරී හොමියෝපති වෛද්‍ය සභාව	සභාපති හොමියෝපති වෛද්‍ය සභාව	කමිටු සමාජික හොමියෝපති වෛද්‍ය සභාව	සකස් කළේ කේ.එස්.පියසිරි විශ්‍රාමික ප්‍රධාන ගණකාධිකාරී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

	2018 රු	2017 රු
සටහන 01 වෙනත් ලැබීම්		
වාර්ෂික ගාස්තුව	26,350	4,050
විවිධ ආදායම්	21,500	46,950
	47,850	**51,000**
සටහන 02 සේවක පිරිවැය		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	11,785,936	10,325,463
සේවක අර්ථසාධක අරමුදල්	1,379,023	1,230,949
සේවා නියුක්ති භාර අරමුදල්	344,756	307,737
	13,509,715	**11,864,149**
සටහන 03 අනෙකුත් ගෙවීම්		
විගණන ගාස්තු	-	61,755
දුරකථන ගාස්තු	83,644	75,639
විවිධ වියදම්	26,522	242,567
විදුලි ගාස්තු	68,695	53,127
ජල වියදම්	50,507	55,264
ගමන් වියදම්	43,275	1,570
ඉන්ධන වියදම්	11,000	13,500
තැපැල් ගාස්තු	20,785	5,815
මුද්‍රණ ගාස්තු	120,526	82,690
වෛද්‍ය සහාව සඳහා වූ විවිධ වියදම්	-	33,646
ලිපි ද්‍රව්‍ය	17,708	12,896
සංග්‍රහ වියදම්	53,648	57,094
පරිවර්තන ගාස්තු	30,260	25,740
හැදුනුම්පත් සැකසීමේ වියදම්	-	12,420
සභාපති දීමනා	800,000	975,000
වෛද්‍ය සභා නිලධාරි රැස්වීම් දීමනා	306,000	258,000
දැන්වීම් ගාස්තු	308,200	106,318
කාර්යාල සුළු අළුත්වැඩියා	-	36,761
වරිපනම්	1,884	-
සායන වියදම්	11,281	-
කුලී	36,000	-
නීති ගාස්තු	131,300	-
ප්‍රවාහන	1,780	-
	2,123,015	**2,109,802**
සටහන 04 මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්		
වර්ෂ අවසාන මුදල් ශේෂය	2,404,226	2,274,507
වර්ෂ ආරම්භක මුදල් ශේෂය	2,274,507	2,334,346
	129,719	**(59,839)**

සටහන 05 කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,702,684	1,626,281
ලංකා බැංකුව	375,923	512,165
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	195,900
	2,274,507	**2,334,346**
සටහන 06 කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,787,553	1,702,684
ලංකා බැංකුව	420,773	375,923
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	195,900
	2,404,226	2,274,507
	129,719	**(59,839)**
සමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත / (ඌණතාවය), මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමග සැසඳීම		
සමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත /(ඌණතාවය)	(311,573)	(430,427)
මුදල් නොවන වෙනස්වීම්		
ක්ෂය වීම්	201,976	120,398
ගෙවිය යුතු වැය වැඩි වීම/අඩු වීම	297,192	250,190
පෙර වර්ෂයේ ගැලපුම් හිතුමේ වාර්ෂික වෙනස්වීම් වැඩි වීම /අඩු වීම	(57,876)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**129,719**	**(59,839)**

හොමියෝපති වෛද්‍ය සභාව

ස්කන්ධය වෙනස්වීම 2018	සංචිත රු
2018.01.01 දිනට ශේෂය	2,562,144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය (ප්‍රදාන)	7,502,334
පෙර වර්ෂයේ ගැලපුම් ගිනුම	(30,416)
සමුච්චිත ඌණතාවය/අතිරික්තය	(1,236,035)
2018.12.31 දිනට ශේෂය	**8,798,027**

2018 දෙසැම්බර් 31 දිනට ශේෂපිරික්සුම

	හර	බැර
බැංකුව (කොමර්ෂල්)	1,787,553	
ගොඩනැගිලි පුණුරුත්ථාපන හා වැඩි දියුණු කිරීම	5,407,281	
වෙනත් උපකරණ	1,450	
පිරියත උපකරණ	3,800,150	
ලංකා බැංකුව	420,773	
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	
ක්ෂය වෙන් කිරීම		1,673,572
ගෙවිය යුතු විගණන ගාස්තු		163,861
ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු		42,000
ගෙවිය යුතු දුරකථන ගාස්තු		5,742
ගෙවිය යුතු විදුලි ගාස්තු		4,408
ගෙවිය යුතු ජල ගාස්තු		9,526
ගෙවිය යුතු වැටුප් හා දීමනා		62,291
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්		3,590
ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල්		898
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා		840,650
ප්‍රාග්ධනය		2,562,144
රජයේ මූලධන ප්‍රතිපාදන (සංචිත)		7,502,334
සමුච්චිත ඌණතා අතිරික්තතා ගිණුම	924,462	
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම	30,416	
පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්		15,632,730
වැටුප් හා දීමනා	11,749,368	
ගෙවිය යුතු ගමන් වියදම්		6,697
අර්ථසාධක අරමුදල්	1,375,138	
සේවා නියුක්ති භාර අරමුදල්	343,785	
සභාපති දීමනා	725,000	
දුරකථන වියදම්	83,744	
විදුලි වියදම්	68,806	
ජල වියදම්	44,958	
වරිපනම් ගාස්තු	1,884	
වෛද්‍ය සහා රැස්වීම් දීමනා	306,000	
සායන වියදම්	13,126	
ලිපි ද්‍රව්‍ය වියදම්	17,708	
ගමන් වියදම් හා නවාතැන් ගාස්තු	49,972	
සංග්‍රහ වියදම්	53,648	
විවිධ වියදම්	26,522	
තැපැල් වියදම්	20,785	

ඉන්ධන වියදම්	11,000	
කුලී වියදම්	36,000	
මුද්‍රණ ගාස්තු	120,526	
නීති ගාස්තු	78,800	
පුවත්පත් දැන්වීම ගාස්තු	308,200	
ප්‍රවාහන වියදම්	1,780	
පරිවර්තන ගාස්තු	30,260	
ගෙවිය යුතු සායනික වියදම්		1,845
බැංකු පොලි		87,001
ලියාපදිංචි ගාස්තු		26,350
විවිධ ආදායම්		21,500
වාර්ෂික ක්ෂය	201,976	
විගණන ගාස්තු	20,000	
ගණකාධිකාරි ගාස්තු	42,000	
පාරිතෝෂික දීමනා	343,036	
බැංකු ගාස්තු හා බදු	5,132	
	28,647,139	**28,647,139**

12. විගණන වාර්තාව

2016 අංක 10 දරණ හෝමියෝපති පනත අනුව පත්කෙරුණු ප්‍රථම වෛද්‍ය සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය මෙම වසරේ එනම් 2018 ඔක්තෝම්බර් 19 දිනෙන් අවසන් විය. උක්ත පනතට අනුව සභාවේ නිල කාලය අවසන් වනවාත් සමගම නව වෛද්‍ය සභාවක් පත්කර ගත යුතු වුවද පෙර පැවති වෛද්‍ය සභාවන්හි කටයුතු සම්බන්ධව පැනනැගී පැවති නෛතික හා ව්‍යුහාත්මක ගැටලු හේතු කොටගෙන එසේ කටයුතු කරනු ලැබීමට නොහැකි තත්වයක් උදා වූ අතර මෙම තත්වයන් යටතේ වසර අවසානය දක්වාම නව වෛද්‍ය සභාවක් පත්කර ගැනීමට හැකි නොවීය. වෛද්‍ය සභාවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෙම වසරේ දී ද සභාවේ ගිණුම් කටයුතු සිදුකරනු ලැබුවේ දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය මඟිනි. කෙසේ වෙතත් නව පනත තුළින් හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව වෙත පවරා තිබූ කාර්යන්ගෙන් විශාල ප්‍රමාණයක් සභාවේ පැත්තෙන් නිම කිරීමට මෙහි නිල කාලය අවසන් වනවාත් සමඟ හැකි වූ බව සඳහන් කළ යුතුය. මෙම වසරට අදාළව සකස් කෙරුණු අවසන් ගිණුම් වාර්තා මේ සමඟ ඉදිරිපත් කෙරේ. එහෙත් මෙහිදී සඳහන් කළයුතු අත්‍යාවශ්‍යම කරුණක් වන්නේ, මෙම වසර සඳහා වන අවසන් ගිණුම් සකස් කළ ද ඒවා සම්මත කිරීමට සභාවක් නොමැති වීම හේතුවෙන් රජයේ විගණනය විසින් මෙම අවසන් ගිණුම විගණනය කිරීම ප්‍රතික්ෂේප කිරීමය. කෙසේ වෙතත් විගණකාධිපතිවරයා විසින් මෙම වසරට අදාළව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ගනුදෙනු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර එය මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	එච්එස්එම්/ඩී/එච්එම්සී /1/18/04	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2019 නොවැම්බර්17 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍වයක් විසින්ම එම අස්ථිත්‍වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍වවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් නිරීක්ෂණ හැර ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට වෛද්‍ය සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති, රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනත	
(i) පනතේ 28 (6) වගන්තිය	ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනාගැනීමට හා හිහහිටි ගාස්තුව හඳුනාගැනීමට හැකි පරිදි හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ii) පනතේ 51 (1) හා 51 (2) වගන්ති	නව වෛද්‍ය සභාව පත්කරන තුරු සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත්කර තිබුණු අතුරු වෛද්‍ය සභාවේ කාලසීමාව 2018 ඔක්තෝබර් 19 දින අවසන් වී තිබුණි. නමුත් පනතේ විධි විධාන ප්‍රකාරව නව වෛද්‍ය සභාව 2019 සැප්තැම්බර් 10 දින වන විටත් පත්කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133	සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය	වර්ෂවලදී ඛ 2015 හා 2014ඳවාගෙන තිබුණු ඖෂධ සංයෝජකවරු 7දෙනෙකු හා වෛද්‍ය නිලධාරී 7දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග දින වන 10 සැප්තැම්බර් 2019 .විටත් පවත්වා නොතිබුණි
(ඈ) 2014 අගෝස්තු 13 දිනැති අංක පීඊඩී25 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවත්, 2009 වර්ෂයේදී අයකර තිබුණු පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකු ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,787,552 ක් විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලැසුම් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබුණු කිසිදු ක්‍රියාකාරකමක් සඳහා වූ ඇස්තමේන්තු ගත පිරිවැය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී, හෝමියෝපති ඖෂධ සංයෝජකයන් පුහුණු කිරීමට, ඇගයීමට හා සහතික ලබාදීමට සහ හෝමියෝපති ඖෂධ හා විලවුන් ආනයනය, අලෙවිය හා පිළියෙල කිරීම පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීමට සැලසුම්කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. 2019 සැප්තැම්බර් 10 දින වන විටත් එම ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් දැකිය නොහැකි විය.

(ඇ) 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 20 (2) වගන්තිය හා 2016 අංක 10 දරන නව හෝමියෝපති පනතේ 18 (1)(අ) වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී තනතුර තාවකාලික තනතුරක් වුවද, 2012 ඔක්තෝබර් 16 දින එම තනතුරට ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. මෙම තනතුර ස්ථිර තනතුරක් ලෙස සලකා පිළියෙල කර තිබුණු බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. නමුත් පනතේ විධි විධානවලට අනුගත වන පරිදි බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරවා ගැනීමට හෝ අවශ්‍ය පරිදි පනත සංශෝධනය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව, පත්වීමේ දින සිට වර්ෂ 3 ක් වූ පරිවාස කාලය තුළ අදාළ නිලධාරියා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. එම විභාගය 2019 සැප්තැම්බර් 10 දින වන විටත් පවත්වා නොතිබුණු බැවින් පරිවාස කාලය දීර්ඝ කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී නොතිබුණු නමුත් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී වාර්ෂික වැටුප් වර්ධක 4 ක් අදාළ නිලධාරියා වෙත ලබා දී තිබුණි.

(ඈ) හෝමියෝපති පනතේ 30 (I) වගන්තිය ප්‍රකාරව, වර්ෂ 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයෙහි නියුක්තව සිටි වෛද්‍යවරුන් වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන විභාගයෙන් සමත්වීමෙන් පසු හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි කළ යුතුවේ. සමාලෝචිත වර්ෂයේදී මෙම විභාගය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණු අතර අයදුම්පත් 189 ක් ලැබී තිබුණි. විභාගය පැවැත්වීම සඳහා නීති සම්පාදනය කිරීම අවසන් කර නොතිබීම හා වෛද්‍ය සභාවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් විභාගය පැවැත්වීමට හා වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට නොහැකිවී තිබුණි.

(ඉ) සායන සඳහා පැමිණෙන රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව ඖෂධ බහාලුම් ලෙස පාවිච්චි කරන ප්ලාස්ටික් ඛප්පි හා කඩදාසි කවර හෝමියෝපති සායන වෙත බෙදාහැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.1,070,487 ක් වූ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඛප්පි 373,752 ක් සහ කවර 392,389 ක් වෛද්‍ය සහා කාර්යාලය හා සායන තුළ ඉතිරිවී තිබුණු අතර ඒවා විනාශවීමේ හෝ කල් ඉකුත්වීමේ අවධානමක් පැවතුණි. එම තොග සම්බන්ධ ලෙජර් ගිණුම් පවත්වාද නොතිබුණි.

(ඊ) සභාව විසින් පවත්වාගෙන යන සායන 7 න් සායන 6 ක රෝගීන්ගේ සමස්ථ සහභාගීත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් වැඩි වී තිබුණද, එක් සායනයක රෝගීන්ගේ සහභාගීත්වය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 10 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අඩුවීම සියයට 29 දක්වා වර්ධනය වී තිබුණි.

(උ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කර නොතිබීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 10 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ගොඩනැගිල්ල වර්ෂ 09 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

සුභාශිංසන

★ ★ ★ ★

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය තුමා

ගරු නියෝජ්‍ය අමාත්‍ය තුමා

ලේකම් සහ අතිරේක ලේකම් වරුන්

හෝමියෝපති වෛද්‍ය සහා සාමාජික සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය